# බස්නාහිර පළාතේ පළාත් සභාව
## மேல் மாகாண மாகாண சபை
## WESTERN PROVINCE PROVINCIAL COUNCIL

බස්නාහිර පළාතේ පළාත් සභාවේ සියළුම ගරු මන්ත්‍රීවරුන් වෙත,

**<u>සභා රැස්වීම</u>**

2013 සැප්තැම්බර් මස 03 වන දින පැවැති සභා රැස්වීමේදී එළඹුණු එකඟතාවය මත හා කල් තැබීම අනුව, බස්නාහිර පළාතේ පළාත් සභාව 2013 සැප්තැම්බර් මස 24 වන දින පෙ.ව. 9.30 ට බත්තරමුල්ල, ශ්‍රී ජයවර්ධනපුර, ඩෙන්සිල් කොබ්බෑකඩුව මාවතේ, අංක 204 හි පිහිටි බස්නාහිර පළාතේ පළාත් සභා ගොඩනැගිලි පරිශ්‍රයේ සභා ශාලාවේදී රැස්වෙන බව කාරුණිකව දැනුම් දෙමි.

එමෙන්ම 2013 සැප්තැම්බර් මස 03 වන දින පැවැති සභා රැස්වීමේදී එළඹුණු එකඟතාවයට අනුව, "***2013 සැප්තැම්බර් මස 17 වන දිනය***" සභා රැස්වීම නොපැවැත්වෙන දිනයක් වන බවද කාරුණිකව සැලකුව මැනවි.

2013 සැප්තැම්බර් මස 24 වන දිනට නියමිත පළාත් සභා රැස්වීමේ න්‍යාය පත්‍රය මේ සමග ඇත.

සුනිල් විජේරත්න,
සභාපති,
බස්නාහිර පළාතේ පළාත් සභාව.

2013.09.03 දින,
සභා ලේකම් කාර්යාලය,
බස්නාහිර පළාතේ පළාත් සභාව,
5වන මහළ, B පර්යන්තය,
සෙත්සිරිපාය,
බත්තරමුල්ල.

# බස්නාහිර පළාතේ පළාත් සභාව - සභා රැස්වීම

# 2013 සැප්තැම්බර් මස 24 වන දින පෙ.ව 09.30 ට

# න්‍යාය පත්‍රය

I. සභාපතිවරයාගේ නිවේදන

II. ලිපි ලේඛන පිළිගැන්වීම

III. කාරක සභා වාර්තා පිළිගැන්වීම

IV. පෙත්සම්

V. ප්‍රශ්න

01. ගරු යූ. ජෝර්ජ් පෙරේරා විපක්ෂයේ ප්‍රධාන සංවිධායකතුමා විසින් , ගරු ප්‍රවාහන, ක්‍රීඩා හා තරුණ කටයුතු, සංස්කෘතික හා කලා කටයුතු, සමුපකාර සංවර්ධන , ආහාර සැපයීම් හා බෙදාහැරීමේ කටයුතු සහ ග්‍රාම සංවර්ධන විෂය භාර අමාත්‍යතුමාගෙන් 2013.08.06 දින අසන ලද ප්‍රශ්නය: (ප්‍ර/V (1)13/12)

අ. අත්තනගල්ල විවිධ සේවා සමුපකාර සමිතියේ සභාපතිවරයා, ගම්පහ දිස්ත්‍රික් ග්‍රාමීය බැංකු සංගමයේ අධ්‍යක්ෂකවරයෙකු බව දන්නේද ?

ආ. ඒ හේතුවෙන් සමුපකාර මණ්ඩලය වාර්ෂික 16.25% ක පොලියක් ලබා දෙන බව දන්වා තිබියදී, සමිතිය සතු මුදල්, ගම්පහ දිස්ත්‍රික් සමුපකාර ග්‍රාමීය බැංකුවේ රුපියල් ලක්ෂ 375 ක් 15.25% පොලියක් මතද, කොළඹ ග්‍රාමීය බැංකු සංගමයේ රුපියල් ලක්ෂ 150 ක් 16% පොලිය මතද, තැන්පත් කිරීමෙන් සමිතියට වාර්ෂිකව රුපියල් 412.500/- පොලිය අහිමි වූ බව දන්නේද ?

ඇ. 2012 වසරේ සභාපතිගේ කැමැත්තට ගම්පහ දිස්ත්‍රික් බැංකු සංගමයේ තැන්පත් කරන ලද මුදල් අධ්‍යක්ෂක මණ්ඩලයේ තීරණය මත ශ්‍රී ලංකා ජාතික සමුපකාර මණ්ඩලයේ තැන්පත් කිරීමෙන් රුපියල් 468,750/- ක අමතර පොලියක් ලැබුණ බව පිළිගන්නේද ?

ඈ. සමිතිය යටතේ පාලනය වන සමුපකාර ෆාමසියට ලබා ගන්නා ඖෂධ සඳහා ලැබෙන කොමිස් මුදල් සභාපති පෞද්ගලිකව තමාම ලබා ගන්නා බව දන්නේද ?

ඉ. සමිතියේ පාරිභෝගික අංශය මාසිකව රුපියල් ලක්ෂ 15 ක පාඩුවක් ලබන බව දන්නේද ?

ඊ. මෙම වංචා හා දූෂණයන්ට එරෙහිව සමිතියේ උපසභාපති ඇතුළුව අධ්‍යක්ෂ මණ්ඩල සාමාජිකයින් තිදෙනෙකු 2013/06/20 දින සිට තනතුරු වලින් ඉල්ලා අස්වී ඇතිබව දන්නේද ?

උ. සභාපතිවරයාගේ විෂමාචාරයන්ට එරෙහිව පියවරක් ගන්නේද ? නොඑසේනම් මන්ද ?

**02.** **ගරු සරත් පතිරණ මන්ත්‍රීතුමා විසින් ගරු ප්‍රධාන අමාත්‍ය, මුදල් හා ක්‍රම සම්පාදන නීතිය හා සාමය, ඉඩම්, අධ්‍යාපන, පළාත් පාලන හා පළාත් පරිපාලන, මිනිස්බල හා රැකීරක්ෂා, ආර්ථික ප්‍රවර්ධන සහ විදුලිබල හා බලශක්ති හා වෙළඳ විෂය භාර අමාත්‍යතුමාගෙන් ඇසීමට :**

(ප්‍ර/V(1)13/14)

අ. බ.ප./කැළ/හේනේගම විද්‍යාලයේ විදුහල්පතිතුමා විසින් පාසැල් වත්තේ තිබූ තේක්ක, ලුණුමිදෙල්ල ඇතුළු ගස් 17 ක් කපා ලී මෝලකට යැවූ බව ඔබතුමා දන්නේද ?

ආ. i මෙම ගස් ඉවත් කිරීම සඳහා අනුමැතිය ලබා දුන් නිලධාරිහු කවුරුන්ද ?

ii අවසර ලබාදුන් ලිපිය සභාගත කල හැකිද ?

ඇ. i මෙම විදුහලේ වාර්ෂිකව පවත්වනු ලැබූ හේමප්‍රතිභා සැණකෙළියේ 2011, 2012 වර්ෂයන් සඳහා ලැබුණු ආදායම කොපමණද ?

ii එම මුදල් තැන්පත් කර ඇත්තේ කිනම් ගිණුමකටද ?

ඈ. i 2012 වර්ෂයේ "හේමප්‍රතිභා" සැණකෙළියේ ආරාධිතයෙකු ලෙස සහභාගී වූ රජයේ අමාත්‍යවරයෙකු ලබා දුන් රුපියල් අනූ දහසේ චෙක්පත ගිණුම් කර ඇත්තේ කිනම් ගිණුමකද ?

උ. i මෙම උත්සවයේ ආරාධිතයෙකු වූ ප්‍රාදේශීය සභාවක සභාපතිවරයෙකු ඇතුළු වෙනත් ආරාධිතයන් ලබා දුන් මුදල් තැන්පත් කරන ලද්දේ කිනම් ගිණුමකද ?

ඌ. i පළාත් සභා මන්ත්‍රී ප්‍රතිපාදන මගින් මෙම විදුහලට ලබා දුන් බස් රථය සඳහා අමතර රුපියල් ලක්ෂ දහ තුනක මුදලක් විවිධ පුද්ගලයන්ගෙන් එකතු කල බව ඔබතුමා දන්නේද ?

ii එම මුදලට සිදුවූයේ කුමක්ද ?

එ. i බ.ප./කැළ/හේනේගම විද්‍යාලයේ විදුහල්පතිවරයා පිළිබඳ පැවැත්වූ විගණන පරීක්ෂණයේ නිර්දේශය කුමක්ද ?

ii එම විගණන වාර්තාව සභාගත කල හැකිද ?

iii නො එසේ නම් ඒ මන්ද ?

VI. නොපැමිණ සිටීමේ අවසරය පිළිබඳ යෝජනා

VII. අමාත්‍යාංශ නිවේදන/අමාත්‍යවරුන්ගේ ප්‍රකාශ

VIII. පෞද්ගලික පැහැදිලි කිරීම

IX. පොදු කටයුතු

01. **ගරු ප්‍රධාන අමාත්‍ය, මුදල් හා ක්‍රම සම්පාදන, නීතිය හා සාමය, ඉඩම්, අධ්‍යාපන, පළාත් පාලන හා පළාත් පරිපාලන, මිනිස්බල හා රැකීරක්ෂා, ආර්ථික ප්‍රවර්ධන සහ විදුලිබල හා බලශක්ති හා වෙළඳ විෂය භාර අමාත්‍යතුමා (බ.ප):**

යෝජනාව :

<u>2013 පරිපූරක ඇස්තමේන්තුව - 01</u>

"2013 වර්ෂය සඳහා බස්නාහිර පළාතේ පළාත් සභාවේ අමාත්‍යාංශ / දෙපාර්තමේන්තු හා කාර්යාලවල පහත සඳහන් අවශ්‍යතාවයන්ට එනම්,

i. රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ 18/2012 මගින් වැඩිකරන ලද දීමනා, සෞඛ්‍ය අමාත්‍යාංශ පොදු චක්‍ර ලේඛ අනුව සෞඛ්‍ය ක්ෂේත්‍රයේ වැඩි වූ දීමනා සහ පුද්ගලික පඩිනඩි යටතේ අවශ්‍ය අතිරේක වියදම් දැරීම සඳහා ප්‍රතිපාදන සැලසීම,
ii. බස්නාහිර පළාත තුළ ආදාහනාගාර ඉදිකිරීම සඳහා රජයේ ප්‍රදාන වශයෙන් ලැබී ඇති මුදල වියදම් දැරීම සඳහා ප්‍රතිපාදන සැලසීම,
iii. පළාත් සභා සංවර්ධන වැඩසටහන් අපේක්ෂිත ඉලක්ක කරා ළඟා කරවීමට අවශ්‍ය අතිරේක ප්‍රතිපාදන සැලසීම,
iv. 2012 වර්ෂයේ ලෝක බැංකු ව්‍යාපෘති යටතේ බස්නාහිර පළාත් සභාවට ලැබී තිබූ නමුත්, ව්‍යාපෘති අනුමත නොවීම හේතුවෙන් ඉතිරිව තිබූ මුදල්, 2013 වර්ෂයේ ක්‍රියාත්මක ද්විතියික පාසැල් දහස සංවර්ධනය කිරීමේ වැඩසටහන යටතේ 'මහින්දෝදය' විද්‍යාගාර ඉදිකිරීම සඳහා යොදා ගැනීමට අනුමැතිය ලැබී ඇති හෙයින් ඒ සඳහා අවශ්‍ය ප්‍රතිපාදන සැලසීම, හා
v. ගුරු පුහුණු වැඩ සටහන් සඳහා රජයේ ප්‍රදාන යටතේ ලැබී ඇති මුදල් වියදම් දැරීම සඳහා ප්‍රතිපාදන සැලසීම,

යන කරුණු වෙනුවෙන් පරිපූරක ඇස්තමේන්තුවක් ඉදිරිපත් කළ යුතුව ඇති හෙයින්, ඒ සඳහා ඉදිරිපත් කරන ලද 2013 පරිපූරක ඇස්තමේන්තුව 01 (පුනරාවර්තන වියදම් රු. 624,746,000/-, මූලධන වියදම් රු. 793,000,000/-, මුළු ප්‍රතිපාදනය රු. 1,417,746,000/-) අනුමත කල යුතුය."

02. ගරු ප්‍රධාන අමාත්‍ය, මුදල් හා ක්‍රම සම්පාදන, නීතිය හා සාමය, ඉඩම්, අධ්‍යාපන, පළාත් පාලන හා පළාත් පරිපාලන, මිනිස්බල හා රැකීරක්ෂා, ආර්ථික ප්‍රවර්ධන සහ විදුලිබල හා බලශක්ති හා වෙළඳ විෂය භාර අමාත්‍යතුමා (බ.ප) :

යෝජනාව :

<u>2013 පරිපූරක ඇස්තමේන්තුව - 01ට අදාළ විසර්ජන ප්‍රඥප්තිය</u>

"2013 වර්ෂයේ පරිපූරක ඇස්තමේන්තුව 01 සඳහා අවශ්‍ය රුපියල් එකසිය හතලිස් එක් කෝටි හැත්තෑ හත් ලක්ෂ හතලිස් හය දාහක් (1,417,746,000/) වූ මුදල බස්නාහිර පළාත් සභා අරමුදලින් ගෙවීමටත්, එකී බස්නාහිර පළාත් සභා අරමුදලට ශ්‍රී ලංකා ආණ්ඩුවෙන් ප්‍රදාන වශයෙන් හෝ වෙනත් ආකාරයකින් ලැබෙන මුදල් භාර ගැනීමටත් බලය දෙනු ලබන 2013 අංක .................... දරණ විසර්ජන ප්‍රඥප්තිය අනුමත කළ යුතුය.

## X. පෞද්ගලික මන්ත්‍රීවරුන්ගේ කටයුතු

01. ගරු සිරිකමල් පිලිෂියන් ද සිල්වා මන්ත්‍රීතුමා :

ශ්‍රී ලංකාව නිදහස් අධ්‍යපනය ක්‍රියාත්මක වන රටක් බව ප්‍රකාශිතය එහෙත් රට තුල මධ්‍යම රජය, පළාත් සභා, පෞද්ගලික, ජාත්‍යන්තර, යනුවෙන් පාසැල් පද්ධතියක් ක්‍රියාත්මකව ඇති බව අපි දනිමු. මේ අතරින් බහුතර පාසැල් සංඛ්‍යාව අයත් වන්නේ පළාත් සභාවලටය. මෙම පළාත් සභාව වාර්ෂික අය වැය මගින් ප්‍රතිශතයක් ලෙස වැඩිම මුදල් ප්‍රමාණයක් වෙන් කරනු ලබන්නේ ප්‍රධාන අමාත්‍යවරයා නියෝජන කරන අධ්‍යාපන අමාත්‍යංශයටය. එහෙත් අප පළාතේ පාසැල් නඩත්තුව සඳහා වාර්ෂිකව වෙන් කරනු ලබන මුදල ප්‍රමාණවත් නොවන බව බලධාරීන් විසින්ම ප්‍රකාශ කිරීම හේතුවෙන්, දෙමව්පියන්, ආදිසිසුන්, සුභ පතන්නන් හා වෙනත් විවිධ ක්‍රම මගින් විදුහල් වල අඩුපාඩු සකස්කර ගන්නා බව නොරහසකි අවිධිමත් ලෙස සිදුවන මෙම ක්‍රියාවලිය නිසා දෙමාපියන්, සිසුන් පත් වන අපහසුතාවය මග හරවා ගැනීම සඳහා විධිමත් ක්‍රමෝපායක් කඩිනමින් සකස් කළ යුතු යැයි මෙම බස්නාහිර පළාතේ පළාත් සභාව අදහස් කරයි. (යෝ/v(01)13/02)

02. **ගරු ලලිත් එල්ලාවල මන්ත්‍රීතුමා :**

"වර්තමානයේ පවතින පළාත් සභා හා පාර්ලිමේන්තු අනුපාත මැතිවරණ ක්‍රමය ඉදිරිපත් වන අපේක්ෂකයන්ට මෙන්ම ඡන්ද දායකයන්ටද ඉතා අපහසු ගැටළුකාරී මැතිවරණ ක්‍රමයක් වන බැවින්, ඉදිරියේදී පවත්වන සියළු මැතිවරණ නව පළාත් පාලන මැතිවරණ ක්‍රමය මෙන්, පළාත් සභා කොට්ඨාශ මට්ටමින්ද, පාර්ලිමේන්තු මැතිවරණය ආසන මට්ටමින්ද, පැවැත්වීමට කටයුතු කළ යුතු යැයි මෙම බස්නාහිර පළාතේ පළාත් සභාව රජයට යෝජනා කර සිටියි." (යෝ/v(01)13/04)

## XI . සභාව කල් තැබීම

කේ.එච්.ඩී.කේ.සමරකෝන්
ලේකම්,
බස්නාහිර පළාතේ පළාත් සභාව.

2013.09.03 දින,
සභා ලේකම් කාර්යාලය,
බස්නාහිර පළාතේ පළාත් සභාව,
5වන මහල, B පර්යන්තය,
සෙත්සිරිපාය,
බත්තරමුල්ල.